අනවශ්‍ය අතපෙවීම් වලින් තොරව සිය පාසල් කාලය සම්පූර්ණ කරගැනීමට බාලවයස්කරුවන්ට නිදහස තිබිය යුතු බව මාධ්‍ය මාර්ගෝපදේශයන් මගින් පෙන්වා දේ.
ඒ සම්බන්ධයෙන් කතා කිරීමේදී, සිය එකොළොස් හැවිරිදි දියණිය සහ ඥාති දියණිය කෲරත්වයට ලක් කිරීමේ චෝදනාව මත, කාන්තාවක් අත්අඩංගුවට ගැනීමේ පුවතක්, ලංකාදීප පුවත්පත (අප්‍රේල් 05, 2023) වාර්තා කර තිබූ අයුරු විමසා බැලිය හැක. එහිදී, එම දියණිය සහ ඥාති දියණිය "අස්වාභාවික ලිංගික ක්‍රියාවක" නිරත වූ නිසා එසේ සිදුකළ බව අදාළ කාන්තාව පොලිසියට සඳහන් කර ඇතැයි එම පුවත වැඩිදුරටත් දක්වා තිබිණි.
එසේම එම පුවත තුළ, මෙසේ අත්අඩංගුවට ගැනුණු කාන්තාවගේ පදිංචිය සහ නම අනාවරණය කෙරී තිබිණි.
ඔබ සිතන ආකාරයට,
1) මෙම පුවතෙන් සැකපිට අත්අඩංගුවට ගැනුණු මවගේ අනන්‍යතාවය හෙළිදරව් කොට තිබීම ඔස්සේ, එම බාලවයස්කාර දියණියගේ අනන්‍යතාවය ද වක්‍රාකාරයෙන් හෙළිදරව් වීමේ අවදානමක් නොමැති ද?
2) මෙම සිදුවීමේ ස්වභාවය ද සමඟින්, එසේ අනන්‍යතාවය හෙළිදරව් වීම, මෙම බාලවයස් දැරියගේ පාසල් අධ්‍යාපනය අනවශ්‍ය බාධාවන්ගෙන් තොරව සම්පූර්ණ කරගැනීමට බාධාවක් නොවේ යැයි සහතික විය හැකිද?
මූලාශ්‍ර:
https://www.editorscode.org.uk/the_code.php
https://rm.coe.int/media-regulatory.../1680972898
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

